# බ්‍රාහ්මණයන්ගේ සමාජ ස්ථාවරභාවයට හේතු වූයේ සංඝ සමාජයෙහි පැවති දුර්වලතාවන් ද?

## (අනුරාධපුර යුගය ඇසුරින්)

එස්.ආර්.නදීකා කුමුදිනී සිංහබාහු[1]

### හැඳින්වීම

කුල යන්න විවිධ අර්ථ ගෙනේ. උතුරු ඉන්දියානු කුල ක්‍රමයේදී වර්ණයක් හැඳින්වීමට "කුල" යන්න යොදා ගෙන තිබේ. තවද ජාති, දෑ යන්නෙන් ද කුලය අර්ථ ගැන්වේ. සිඛවළඳ විනිසෙහි " දෑ" යන්නෙන් ඛත්තිය, බ්‍රාහ්මණ, වෙස්ස වැනි කුල හඳුන්වා තිබේ.

"මෙසෙයින් දන්නේ සැඬල්හි කැතයෙහි යනාදී හීන උකට දෑයි"

ත්‍රිපිටකයෙහි විවිධ තැන්හි ජාති යන්න යොදා ඇත්තේ වර්ණයන් හැඳින්වීම සඳහාය. ඒ අනුව කුල, ජාති, වර්ණ යන සෑම වචනයකින් ම ගම්‍ය වන්නේ චතුර්වර්ණ ප්‍රධාන කොට ගත් වර්ණයන් බව පැහැදිලිය. චණ්ඩාල, පුක්කුස, වෙන, නෙසාද ,උක්කුට්ට, පුක්කුස ඇතුලු ජාතීහු නම් බොහෝ වෙති. මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බ්‍රාහ්මණයන් පහල වූ බවත් බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍යයන් මහා බ්‍රහ්මයාගේ අංගයන් බවත් ශුද්‍රයන් පතුල්වලින් උපන් අතරම ඔවුන් අනාර්යන් යැයි කියවෙන උතුරු ඉන්දියානු කුල ක්‍රමය තුළ සමාජ භේදය දැඩි සේ ප්‍රකට වනු දැකිය හැකිය.

### පර්යේෂණ ගැටලුව

එම සමාජ බලපෑම ලංකා සමාජය කෙරෙහි ද අවස්ථා කිහිපයකදී එල්ලවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා සමාජය කෙරෙහි බ්‍රාහ්මණ බලපෑම ඉස්මතු වීමට හේතු විය. මේ අනුව මෙම අධ්‍යනයෙන් උතුරු ඉන්දියානු කුල ක්‍රමය තුළ බලවත්ම සමාජ පංතිය වූ බ්‍රාහ්මණයන්ගේ බලපෑම ලංකා සමාජයට කළ බලපෑම අධ්‍යයනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. එහිදී ලංකා සමාජය තුළ අනුරාධපුර අගභාගය වන විටදී බ්‍රාහ්මණයන් ස්ථාවර සමාජ පංතියක් ලෙස නැගී ඒම කෙරෙහි සංඝ ශාසනය තුළ ඇති වූ යම් යම් දුර්වලතා හේතු වූවාද යන පර්යේෂණ ගැටලුව ඔස්සේ කරුණු අධ්‍යයනය කෙරිණි. එම ගැටලුව ඔස්සේ කරුණු ගොණු කිරීමේදී යොදා ගත් නිදර්ශන බොහොමයක් අනුරාධපුර යුගයට සීමා කරනු ලැබිණි.

---

[1] සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
nadee19870312@gmail.com

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී ක්‍රමවේදය ලෙස මූලාශ්‍රය අධ්‍යයනය හෙවත් ඓතිහාසික ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ඒ යටතේ ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම ද්විතීයික මූලාශ්‍රය ගණනාවක්ද උපයෝගී කර ගනු ලැබිණි. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ මහාවංසය, සිඛවළඳවිනිස, ධම්පියා අටුවා ගැටපදය, මහාවංසටීකාව, දාඨාවංසය ඇතුළු මූලාශ්‍රය ගණනාවක්ම යොදා ගැනිණි. එමෙන්ම මෙහිලා ශිලාලේඛන දක්වන දායකත්වය ද අගනේය.

## අරමුණු

විශේෂයෙන්ම, බ්‍රාහ්මණ බලපෑම ලංකා සමාජය කෙරෙහි බලපෑමට, ලංකාව හා ඉන්දියාව අතර පැවති කිට්ටු සබඳතාවය ප්‍රධානතම සාධකය විය. ලංකාවේ පරම්පරාගත ඉතිහාසය ආරම්භ වන්නේ විජයාගමනයේ පටන්ය. එවක් පටන් ම බමුණු සමාජයේ බලපෑම ද ලක්දිවට එල්ල විය. ඒ අනුව,

- ලංකාවට බ්‍රාහ්මණ බලපෑම එල්ල වූ අවස්ථාවන් කවරේද?
- එම බ්‍රාහ්මණ බලපෑම මෙරට සමාජ ආර්ථික, දේශපාලනික අංශ කෙරෙහි කරන ලද වෙනස්කම් මොනවාද?
- බුදුදහම ස්ථාපනය වීම හා එය බ්‍රාහ්මණ සමාජය කෙරෙහි කොයි ලෙසකට බලපෑවාද?
- රජු හා බ්‍රාහ්මණයන් අතර පැවති සබඳතාවය කෙබඳුද?
- බ්‍රාහ්මණයන් කෙරෙහි වැඩි අනුග්‍රහයක් දක් වූ පාලකයන් කවුරුන්ද?

මේ ආදී ප්‍රශ්න ඔස්සේ කරුණු අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ විය. ඒ මත අනුරාධපුර යුගය අගභාගයේදී බ්‍රාහ්මණයන්ට සමාජයේ පැවති තත්ත්වය අධ්‍යයනය කිරීම අපේක්ෂාව විය.

මෙම අධ්‍යයනයේ දී අනුරාධපුර අවසාන භාගය වන විට බ්‍රාහ්මණ සමාජය ස්ථාවර තත්ත්වයකට පත්වීම කෙරෙහි හේතු වූයේ සංඝ සමාජයේ පැවති දුර්වලතා ද නැතිනම් ඒ සඳහා වෙනත් හේතූන් බලපෑවාද යන්න තහවුරු කිරීම සඳහා ඓතිහාසික සිදුවීම් නිදර්ශන කොට ගනු ලැබිණි.

වට්ටගාමිණී අභය රජු අභයගිරි විහාරය කරවා තමාට හිතවත් වූ මහාතිස්ස තෙරුන්ට පිදූ ආකාරයත් අභයගිරිවාසීන් ථෙරවාදයෙන් වෙන් වී ගිය ආකාරයත් මහාවංසයෙහි කියවේ. එම සංඝයා ධම්මරුචි නිකායේ ඉගැන්වීම් පිළිගැනීමත් සමග ධම්මරුචි නිකාය නමින් හැඳින් වූ බව නිකාය සංග්‍රහයෙහි විස්තර වේ. මෙසේ නිකාය භේදය ඇති වීම සංඝ සමාජය දෙදරා යාමේ මුල් අවස්ථාවයි. භාතිය රජ දවස විනය ශික්ෂා පදයක් පිළිබඳ අභයගිරිවාසී භික්ෂූන් හා මහා

විහාරවාසී භික්ෂූන් අතර මතභේදයක් ඇති විය. රජු මෙය විසැඳීම සඳහා දීඝකාරායන බ්‍රාහ්මණ ඇමතියා පත් කළ බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ. භික්ෂූන් අතර ඇති වූ ප්‍රශ්නයක් විසැඳීම සඳහා බ්‍රාහ්මණයෙකු යොදා ගැනීමද සංඝ සමාජයට එල්ල වූ අභියෝගයකි. මනෝරථපූරණී අටුවාවෙහිද මහාවිහාරවාසී තරුණ භික්ෂුවකගේ අසංවරභාවය ගැන විස්තර කරයි. ගෝඨාභය රජ දවස වෛතුල්‍යවාදය බුද්ධභාෂිත නොවන බව දැන ඒ ගත් පාප භික්ෂූන් හැට දෙනෙකු වෙර ලකුණු ඔබ්බවා දේශ ත්‍යාග කර වූ බව නිකාය සංග්‍රහයෙහි කියවේ. එහිම සාගලිය නිකාය බිහිවීම පිළිබඳ සඳහන් කරයි. ථුල්ලත්ථන රජ කරවීම සඳහා කුමන්ත්‍රණය කළේ ථූපාරාමවාසී භික්ෂූන්ය. ලජ්ජිතිස්ස රජු භික්ෂූන්ට අනුග්‍රහ නොදක්වන්නේ ද මේ නිසාවෙනි. ඛනිරජානුතිස්ස රජ දවස ද භික්ෂූන් හැට නමක් ඝාතනය කළ බව වංසකතාව කියයි. අනුරාධපුර යුගය තුල භික්ෂූන් භික්ෂූන් අතරත් රජවරු හා භික්ෂූන් අතරත් ගැටුම් ඇති වූ අවස්ථා මූලාශ්‍රයවල අවස්ථා ගණනාවකදී හමුවේ. මේ සමග ක්‍රමයෙන් රජවරු බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දැක්වීමේ ද වර්ධනයක් ඇති විය. කාශ්‍යප රජු භික්ෂූන් හා සමාන පරිදි බ්‍රාහ්මණයන්ටද අනුග්‍රහ දැක් වූ බව වංසකතාවේ කියවේ.

"ගිහීනංචෙව භික්ඛූනං බ්‍රාහ්මණානංච ඛත්තියො වත්තාපයී සකාචාරෙ"

වන මිහිඳු රජු විසින්ද ජරාජීර්ණ වූ හිංදු දේවාල පිළිසකර කළ බව මහාවංසය සඳහන් කරයි. සේන රජු ද තුන් නිකාය සංශෝධනය කොට බ්‍රාහ්මණයින්ට ද අනුග්‍රහ දැක්වීය. මෙබඳු නිදර්ශන රාශියක් මූලාශ්‍රයගතය. කෙසේ වෙතත් මෙහිදී පැහැදිලිවම සංඝ සමාජය තුළ ඇති වූ භේදබින්නවීම්, නිකාය බෙදීම්, දූෂණ, කුමන්ත්‍රණ, භික්ෂු නෙරපීම්, විනය පිරිහීම් ආදිය නිසා සංඝ සමාජයෙහි පැහැදිලි බිඳ වැටීමක් සිදු වූ බව කිව හැකිය. මේ නිසා මොග්ගල්ලාන, කුමාර ධාතුසේන, සිලාමේඝවණ්ණ, අග්ගබෝධි යන රජවරුන්ගේ කාලවලදී නිකාය සංශෝධන කිහිපයක්ම සිදු කෙරිණි.

තවද ලංකාවේ පැවති දේශපාලන වාතාවරණය සලකා බැලීමේදී මෝරිය ලම්භකර්ණ බල තරඟය ද මෙරටට බ්‍රාහ්මණ සම්ප්‍රදායේ බලපෑම් වර්ධනය වීම කෙරෙහි හේතු සාධක වූ බව කිව හැකිය. බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දැක් වූ පාලකයන් ගැන අවධානය යොමු කිරීමේදී පැහැදිලිවම පෙනෙන කරුණ නම් ඔවුන් මානවම්මගෙන් පැවත එන්නන් බවයි. සේන, සේන, මහින්ද මානවම්ම පරපුරෙන් පැවත එන්නන්ය.

විශේෂයෙන්ම බ්‍රාහ්මණ බලපෑම ලංකාව කෙරෙහි යොමු වීම වඩාත් කැපීපෙනෙන අංශයක් ලෙස වාස්තු විද්‍යාත්මක හා කලා නිර්මාණයන් දැක්විය හැකිය. 07 වන ශත වර්ෂයෙන් පසුව කලා නිර්මාණ බොහොමයක ද ඉන්දීය ආභාෂය පිළිබිඹු කරයි. නිදර්ශන ලෙස ගත් විට නාලන්දා ගෙඩි ගෙය, රන්මසු උයනේ පොකුණු කැටයම්, ඉසුරුමුණියේ මිනිසා හා අශ්ව හිස රැගත් අර්ධෝන්නත කැටයම, අභයගිරියෙන් හමු වූ අර්ධ නටේශ්වර ලෝකඩ ප්‍රතිමාව ඇතුලු කලා

නිර්මාණයන් රාශියක් පිළිබඳ නිදර්ශන හමු වේ. විශේෂයෙන් ලක්දිව ලේඛන කලාව කෙරෙහි පල්ලව ආභාෂය ලැබී ඇති අයුරුද මෙහිලා වැදගත් වූ නිදර්ශනයකි. මේ සියල්ල තුළ පැහැදිලි වශයෙන් දකුණු ඉන්දීය සංස්කෘතියෙහි මෙන්ම කලා ශිල්පවල ආභාෂය පිළිබිඹු වීම මත ලංකාව හා ඉන්දියාව අතර පැවති ආගමික සබඳතාවත් බුදු දහමට හා දේශීය සංස්කෘතියට තර්ජනයක් වන පරිදි බ්‍රාහ්මණ බලපෑම නැගී ආ අයුරුද ඉතා පැහැදිලි ලෙස ගම්‍ය කරවයි.

**නිගමනය**

මෙසේ විජයාගමනයේ පටන් අනුරාධපුර යුගය අවසානය දක්වා කාල පරාසය තුල යොදා ගත් නිදර්ශන මත එළඹිය හැකි නිගමන කිහිපයකි. එනම් මෙරට බ්‍රාහ්මණ බලපෑම විජයාවතරණයේ පටන්ම එල්ල වූවකි. අනුරාධපුර යුගය අවසානය වන විටදී එහි උච්චතම අවස්ථාවන් නිරූපණය කරයි. මෙලෙස බ්‍රාහ්මණයන් ස්ථාවර සමාජ පංතියක් ලෙස නැගී ඒම කෙරෙහි හේතු සාධක ගණනාවක් බලපා තිබේ. ඒ අතර,

- ලංකාව හා ඉන්දියාව අතර පැවති කිට්ටු සබඳතාව.
- රජවරු හා බමුණන් අතර කිට්ටු සබඳතාව නිසා එකිනෙකා ඔවුනට අනුග්‍රහ දැක්වීම.
- බමුණන් උගත් බහුශ්‍රැත පිරිසක් වීම.
- පෙර අපරදිග වෙළදාමේ මධ්‍යස්ථානයක් ලෙස ලංකාව ප්‍රසිද්ධ වීම.
- මෞර්ය ලම්භකර්ණ බල අරගලය.

මේ ආදී වු හේතු සාධක ගණනාවක් පදනම් කොට ගෙන මෙරට බ්‍රාහ්මණ බලය වර්ධනය වීම කෙරෙහි අවශ්‍ය පසුබිම නිර්මාණය වූ බව පැහැදිලිය. එවැනි පසුබිමක් පැවති සමයකදී සංඝ සමාජයේ පැවති දූර්වලතා හා පවතින තත්ත්වයට අභියෝගයක් වීමට භික්ෂූන් ඉදිරිපත් නොවීම නිසා ද එය අවස්ථාවක් කර ගත් බ්‍රාහ්මණ කොටස් බුදු දහම අභිබවා නැගීසිටි බව පැහැදිලිය.

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුර යුගය, බමුණන්, ඉන්දීය සංස්කෘතිය, බුදුදහම

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මහාවංසො.* (1959). බුද්ධදත්ත හිමි, පී. (සංස්.), කොළඹ.

*නිකාය සංග්‍රහය.* (1962). විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ. (සංස්.) කොළඹ.

*ජාතක අටුවා ගැටපදය.* (1943). ජයතිලක, ඩී. බී.(සංස්.) කොළඹ.

*සිඛවළඳවිනිස* (1934). ජයතිලක, ඩී. බී. (සංස්.) කොළඹ.

ගුණවර්ධන, රණවීර. (2001). *සිවුර හා නගුල,* කොළඹ.